චක්‍රලේඛ අංකය:- 1995/20

මගේ අංකය :- 4/අධ්‍ය. සේ. /ආ /1/125
අධ්‍යාපන සේවා අයාතන ශාඛාව,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය'
බත්තරමුල්ල.

1995.07.24 වන දින.

සියලුම අතිරේක ලේකම්වරුන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
ප්‍රධාන කොමසාරිස් (ගු. අ. ප. හා අ. වි. නි)
විභාග කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්
පළාත් අධ්‍යාපන ලේකම්වරු
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් සේවයෙන් විශ්‍රාම ගැන්වීම

ආයතන සංග්‍රයේ V වන පරිච්ඡේදයේ 5 වන ඡේදයේ විධිවිධාන කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. ඔබ දෙපාර්තමේන්තුවේ සේවය කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියට අයත් නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේදී පහත සඳහන් ක්‍රියා පටිපාටිය අනුගමනය කරන මෙන් මෙයින් දන්වමි.

(1) වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට හය (6) මසකට කලින් තමාගේ සේවා කාලය දීර්ඝ කරවා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් නොකරන නිලධාරීන්,

(2) දීර්ඝ කරනු ලැබූ සේවා කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් තුන් (3) මසකටත් කලින් තව දුරටත් සේවය දීර්ඝ කිරීම සඳහා ලිඛිත ඉල්ලීමක් නොකරන නිලධාරීන් හා

(3) අනිවාර්ය වයස් සීමාව වූ අවුරුදු 6 ට සම්පූර්ණ වීමට මාස 4 ක් තිබෙන නිලධාරීන් පිළිබඳව සේවයෙන් විශ්‍රාම ගැන්වීම සඳහා මා වෙත වාර්තා කළ යුතුය.

(4) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට/ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියට අයත් සියලුම නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේදී මෙහි පසුපිට දක්වෙන සංශෝධිත ආදර්ශ ආකෘතිය මගින් ඔබගේ නිර්දේශය ඉදිරිපත් කල යුතුවේ. මෙම නිර්දේශය හැකිනාක් දුරට අදාල දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් පෞද්ගලිකවම අත්සන් කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

(5) කොට්ඨාශ/කලාප කාර්යාල විසින් පළාත් කාර්යාල වෙතද පළාත් කාර්යාලය දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් එම අමාත්‍යාංශයටද සේවය දීර්ඝ කිරීමේ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ද කලානුක්‍රමික සීමා නියම කල යුතුවේ.

(6) නියමිත දින ඉකුත් වීමෙන් පසුව සේවා දීර්ඝ කිරීමක් නොලබා සේවයේ රැඳී සිටින නිලධාරීන්ගේ වැටුප් ගෙවීම පිළිබඳ වගකීම් අමාත්‍යාංශය නොදරයි. සේවය දීර්ඝ කිරීම අනුමත නොකරනු ලැබුව හොත් නියමිත දින ඉක්මවා නිලධාරියා සේවයේ යොදවා ගැනීම පිළිබඳ වගකීම අදාල ආසන්නතම ප්‍රධානියා හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා වෙත පැවරේ.

(7) සිරිතක් වශයෙන් සෑම නිලධාරියෙකුගේම සේවය දීර්ඝ කිරීම නිර්දේශ කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කල යුතු නැත. නිලධාරියෙකු වයස අවුරුදු 55 න් ඔබ්බට විශේෂයෙන් ම වයස අවුරුදු 58 න් ඔබ්බ ට සේවයේ රඳවා ගත යුත්තේ සේවයේ අවශ්‍යතාවයන්, සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩු, නිලධාරියාගේ විශේෂ හැකියාවන්/, කුශලතාවයන් හෝ දැනුම, ඔහුගේ හැසිරීම සේවය කෙරෙහි දක්වන උනන්දුව, මහජනයා සහ මහජන නියෝජිතයින් සමග ද ආයතනයේ අනෙකුත් කාර්ය මණ්ඩලය සමඟද කටයුතු කිරීමේදී නිලධාරියාගේ සාර්ථක අසාර්ථක භාවය වැනි කරුණු ඉතා මැනවින් හා සුපරීක්ෂාකාරීව සලකා බැලීමෙන් පසු සේවය දීර්ඝ කිරීම නිර්දේශ කිරීම හැම අතකින්ම යෝග්‍ය වන්නේ නම් පමණි.

සේනානායක උපසේන
අතිරේක ලේකම්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

මගේ අංකය
අධ්‍යාපන දෙපාර්තමේන්තුව/
කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය
199................. වෙනි දින.

අධ්‍යා./ලේ. (අධ්‍යාපන සේවා ආයතන ශාඛාව)

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීම

01 නිලධාරියාගේ නම (I) මුලකුරු සම :-
(II) සම්පූර්ණ නම:-

02 ශ්‍රී. ලං. අ. ප. සේ./ශ්‍රී. ලං. වි. සේ.
ට අයත් පංතිය/ශ්‍රේණිය:-

03 දැනට දරණ තනතුර හා නිලධාරියාට පැවරී ඇති කාර්‍ය භාරයන් පිළිබඳ විස්තරයක් :-

04 සේවා ස්ථානය :-

05 (අ) උපන් දිනය :-
(ආ) මීලඟ උපන් දිනයට වයස :-

06 වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනය :-

07 වයස අවුරුදු 55 න් ඔබ්බට සේවා කාලය දීර්ඝ කර තිබේ නම් අමාත්‍යාංශයේ ලිපි ගොනුවේ යොමුව දක්වන්න :-

08 විශ්‍රාම ගන්වන ලෙස නිලධාරියා ඉල්ලා ඇති දිනය (නිලධාරියාගේ ඉල්ලීමද මේ සමඟ එවම්)

09 නිලධාරියාට විරුද්ධව විනය පරීක්ෂණ හෝ විගණන විමසුම් කිසිවක් තිබේ නම් ඒවායේ විස්තර හා වර්තමාන තත්වය :-

10 නිලධාරියාගෙන් රජයට අයකර ගතයුතු යම් මුදලක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :-

11 නිලධාරියාට විරුද්ධව මහජන පැමිණිලි හා පෙත්සම් ආදිය කිසිවක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර

12 පසුගිය තුන් වසර තුළ නිලධාරියා වැටුප් රහිත නිවාඩු ලබා තිබේද? ලබා තිබේනම් ඒ පිළිබඳ විස්තර :-

13 නිලධාරියාගේ රාජකාරී කටයුතු, පැමිණීම හා හැසිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ :-

14 විශ්‍රාම ගැන්වීම පිළිබඳ නිර්දේශය :-

15 පසුගිය පස් වසර කාලය තුළ නිලධාරියාගේ සේවා ස්ථාන
1 ......................................
2 ......................................

දිනය :-

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
නම හා නිල නාමය